# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

## SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## වෙළඳ අමාත්‍යාංශය

# ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## (1) අධ්‍යක්ෂ - කෘෂි අපනයන (HM 1-1)

සැපයුම් සංවර්ධනය, තාක්ෂණික සංවර්ධනය, ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, ඇසුරුම් සංවර්ධනය හා පුහුණුව, නිෂ්පාදන සංවර්ධනය ආරම්භ කිරීම සහ එම නිෂ්පාදන අපනයන වෙළඳපොළට අනුවර්තනය කිරීම ඇතුළු ඒකාබද්ධ වැඩසටහන් තුළින් තෝරා ගත් කෘෂිකර්මික නිෂ්පාදන සමූහයක අපනයන කාර්ය සාධනය වැඩි දියුණු කිරීම කෘෂි අපනයන අධ්‍යක්ෂවරයාගේ වගකීම වේ. මෙයට අදාළ මානව සම්පත් සංවර්ධනය සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙන්ම අංශයේ සමස්ත පරිපාලනය ද ඇතුළත් වේ.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අලෙවිකරණ/ ජාත්‍යන්තර සබඳතා/ ආර්ථික විද්‍යාව/ වාණිජ්‍යය/ විද්‍යා/ කෘෂිකර්ම/ ව්‍යාපාර පරිපාලනය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් ලබාතිබීම හා අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ උපාධි සුදුසුකම ලබා ගැනීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක/ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබා තිබීම.

## (2) අධ්‍යක්ෂ - මුදල් (HM 1-1)

මූල්‍ය ප්‍රතිපත්ති සැකසීම, මූල්‍ය කටයුතු සැලසුම් කිරීම සම්බන්ධයෙන් ආයතනයට මග පෙන්වීම හා කළමනාකරණයට තොරතුරු සැපයීම, අයවැය පාලනය, ගිණුම්කරණය, පිරිවැය හා මූල්‍ය වාර්තා පිළියෙල කිරීම, ණය මුදල් අය කර ගැනීම, බැංකු කටයුතු හා මූල්‍ය කළමනාකරණය, විගණනය හා රක්ෂණ කටයුතු සම්බන්ධව කටයුතු කිරීම, අපනයන සංවර්ධන අරමුදල වැඩි දියුණු කිරීමේ හා උපදේශනය සම්බන්ධ වගකීම ආයතනික අවශ්‍යතා අනුව මූල්‍ය හා ගිණුම් වාර්තා පිළියෙල කිරීම, ක්‍රියාකාරී සැලැස්ම හා සම්බන්ධිත ගිණුම් සේවා සැලසීම ආයතනයේ මූල්‍ය හා අරමුදල් තත්ත්වය සෑම අධ්‍යක්ෂ මණ්ඩල හා විගණනය හා කළමනාකරණ කමිටු රැස්වීමට පෙර වාර්තා කිරීම මණ්ඩලයේ ප්‍රසම්පාදන හා සැපයුම් කටයුතු අධීක්ෂණය කිරීම.

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ගිණුම්කරණය හෝ අදාළ ක්ෂේත්‍රයක උපාධියක් **හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම **හෝ**

එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම **හෝ**

වරලත් සහතිකලත් ගණකාධිකාරී ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම **සහ**

කළමනාකරණය හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබාතිබීම සහ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් ලබාතිබීම.

**ද්විතීයනය :**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරීන් ද්විතීයන පදනම යටතේ පත්කිරීම සඳහා සලකා බලනු ඇත.

**වැටුප් පරිමාණය (HM 1-1) :** රු. 80,295/= – 15 X 2,270 – රු. 114,345/= (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

ඉහත සඳහන් තනතුරු සඳහා වයස අවුරුදු 55 ට නොවැඩි අයට ඉල්ලුම් කළ හැක. රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල අපේක්ෂකයින්ට ඉහත වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් සුදුසුකම්**

- සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් හෙබි විය යුතුය.

**තනතුර සඳහා හිමි වෙනත් ප්‍රතිලාභ :**

- ❖ 2016.10.27 දිනැති PED1/2015 (i) චක්‍රලේඛය අනුව වාහනයක් ලබාදෙනු ලැබේ.
- ❖ අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ❖ ලබානොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා.
- ❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය.
- ❖ සේවක අර්ථසාධක අරමුදල – සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙල :**

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇත්නම්, අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබාගත් අයදුම්පතක් 2021.06.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ පහත දක්වා ඇති ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අමුණා එවිය යුතුය. අමතර පිටපතක් **vasanthag@edb.gov.lk** විද්‍යුත් තැපෑලට යොමු කළ යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල් වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ. තෝරා ගැනීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.


**අධ්‍යක්ෂ ජනරාල්,**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB – EDB ටවර්,**

**අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුර : 011-2300700**